දිනමිණ සිළුමිණ
The Silumina
epaper

# SLITA ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## (කර්මාන්ත අමාත්‍යාංශය)

# ඇබෑර්තු

අප ආයතනය රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය සඳහා පුහුණු කිරීම්, උපදේශන සේවා, පරීක්ෂණාගාර කටයුතු, තාක්ෂණික සේවා හා තාක්ෂණික ව්‍යාපෘති හා උපදේශන සේවා සපයන රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. එහි පහත සඳහන් ඇබෑර්තුව ඇත.

**ප්‍රසම්පාදන නිලධාරී II ශ්‍රේණිය**

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අපේක්ෂකයින් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලන, කළමනාකරණ, වාණිජ, ගිණුම්කරණ හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය.

අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම.
2. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2) II ශ්‍රේණියේ අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීම.

වයස : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

වැටුප් පරිමාණය : (JM 1–2 – 2016) රු. 43,355/- 10 ×755 – 18 × 1,135 – 71,335/-

රජයේ අනුමත දීමනා හා අනෙකුත් ව්‍යවස්ථාපිත දීමනා සිදු කරනු ලබයි. අදාළ අමතර අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඔබට වාසියක් ලබා දෙයි. ඉහත තනතුර සඳහා ජීව දත්ත තොරතුරු විස්තර සහිත ව ඔබගේ අයදුම්පත පමණක් 2024 ජනවාරි මස 04 වන දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ආයතනයට සම්බන්ධ නැති දෙදෙනෙකුගේ නම් සහිතව (non-related referees) ලියාපදිංචි තැපෑලෙන්යොමු කරන්න. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කරන්න. (සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසු අයදුම්පත් පමණක් කැඳවනු ලබන අතර, අවසාන තීරණය පාලක මණ්ඩලය සතුය.)

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය**
**අංක 02, කඳවල වත්ත,**
**සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රත්මලාන.**
**දු : අංකය : 011 2632406 වෙබ් : www.slita.ac.lk**